*පඨිත:*
*සමාජ සංස්කෘතික සමීක්ෂා*

## ග්‍රන්ථ විමර්ශන

ග්‍රන්ථ විමර්ශනයක් යනු තමා විසින් කියවන ලද ග්‍රන්ථයක් පිළිබඳ විචාර පූර්වක ලිවීමකි. බොහෝ ග්‍රන්ථ විමර්ශන හුදු විස්තර කථන ලෙස ඉදිරිපත්වන අතර, ඒවා කියවීම වඩාත් නීරස විය හැකිය. අනෙක් අතට, රචකයෙකු වශයෙන් තමාටද ග්‍රන්ථ විමර්ශනය තුළට පිවිසීමට අවශ්‍ය නම්, එම විචාරය හුදු විස්තර කථන වලින් ඔබ්බට ගිය නිර්මාණශීලී මෙන්ම විචාරාත්මක ලිවීමක් විය යුතුය. ශ්‍රී ලංකාව තුළ, ග්‍රන්ථ විමර්ශන සංස්කෘතියක් තවමත් ඇතිවී නොමැති වුවත්, ලොවපුරා බොහෝ සමාජයීය විද්‍යා පර්යේෂකයින්, තම ලිවීම් අරඹන්නේ තමාගේ ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථ විමර්ශන කියවීම, වැදගත් කෘති පිළිබඳ විචාර ලිවීම සහ එම විචාර පළකිරීම තුළිනි. ඒ හරහා, තමාගේ යාවත්කාලිනවන දැනුම සාරාංශ කිරීමේ පුරුද්ද රචකයාට හිමිවනවා මෙන්ම, එම අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ යාවත්කාලීන වන නව දැනුමට පාඨකයා නිරාවරණය කිරීමද සිදුවෙයි. එනයින්, ග්‍රන්ථ විමර්ශකයෙකුගේ භූමිකාව සුලුකොට තැකිය යුතු එකක් නොවන්නේමය. ග්‍රන්ථ විමර්ශනයකට ඇතුළත්විය යුතු මූලික අංග දෙකක් වෙයි.

ඉන් පළමුවැන්න නම්, ග්‍රන්ථයේ මූලික විස්තරයි. එනම්, ග්‍රන්ථ නාමය, කතුවරයාගේ නම, පළකළ වසර, ප්‍රකාශකයා හා ප්‍රකාශිත නගරය, පිටු ප්‍රමාණය, ISBN අංකය සහ පොතේ මිල යනාදියයි. එකී කෘති අන්තර්ජාලයෙන් බාගත කරගත හැකි නම්, ඊට අදල සබැඳියාවද සඳහන් කළ හැකිය. අපගේ අවවාදය වන්නේ, මේ මූලික කරුණු හා ඒවා ඉදිරිපත් කරන පිළිවෙල හා ශෛලිය සඳහා පඨිත වෙබ් අඩවියේ ග්‍රන්ථ විමර්ශන අවකාශය වෙත පිවිස පළකර ඇති විමර්ශන කිහිපයක් කියවා බලන ලෙසය: http://www.patitha.lk/book-review/

ග්‍රන්ථ විමර්ශනයකට ඇතුළත්විය යුතු දෙවන අංගය වන්නේ, පොතේ අඩංගු මූලික කරුණු පිළිබඳ සාරාංශයක් ඉදිරිපත්කිරීමයි. ඇතැම් අවස්ථාවලදී මෙය පරිච්ඡේද වශයෙන් ඉදිරිපත්කළ හැකි අතර, වෙනත් අවස්ථාවලදී මුලු ග්‍රන්ථයේම ප්‍රධාන තර්කය සාරාංශ ලෙස ඉදිරිපත්කළ හැකිය. ග්‍රන්ථ විචාරයක් වඩාත් නිර්මාණාත්මකව ඉදිරිපත්කළ හැකි වුවත්, ඉහත කරුණුවලට අමතරව තවත් කරුණු අත්‍යවශයෙන්ම එවන් රචනයකට ඇතුළත් කළයුතුය. ඒවා නම්, මෙම ග්‍රන්ථය, එම විෂය සම්බන්ධව පළවී ඇති අනෙකුත් ග්‍රන්ථවලින් කෙසේ වෙනස් වන්නේ ද සහ, එම විශාල දැනුම සමග සැසදීමේදී මෙම ග්‍රන්ථය ස්ථානගත වන්නේ කොතැනද යනාදී කරුණුය. විශේෂයෙන්ම පඨිත සාර සංග්‍රහයේ මුද්‍රිත සංස්කරණය වෙත ග්‍රන්ථ විමර්ශනයක් යොමු කරන්නේ නම්, එම ග්‍රන්ථය 2018 වසරේ හෝ ඉන් පසු පළවූ මෙන්ම ශාස්ත්‍රීය වැදගත්කමකින් යුතු ග්‍රන්ථයක්ද විය යුතුය. එනමුත් පඨිත අන්තර්ජාල සංස්කරණය සඳහා නිර්මාණ සාහිත්‍යය හා කාව්‍ය සංග්‍රහ මෙන්ම චිත්‍රපට හා නාට්‍යය හෝ කලා ප්‍රදර්ශන පිළිබඳ විමර්ශන ද ඉදිරිපත් කළ හැක. ඒවා ද 2018 දී හෝ ඉන් පසුව සමාජගත වූ නිර්මාණ විය යුතුය.

වඩාත් විචාරාත්මක කියවීමකට එළඹීම උදෙසා ග්‍රන්ථයක් අවම වශයෙන් දෙවරක්වත් කියවීම අවශ්‍ය වෙයි. එමෙන්ම ග්‍රන්ථයේ ව්‍යුහය අවබෝධ කරගැනීම උදෙසා මූලිකවම, එහි

ඇති රූප, අන්තර්ගතය හැඩගස්වා ඇති ආකාරය ආදියට හුරුවීම වැදගත් වෙයි. ඉන්පසුව පොතෙහි හැඳින්වීම සහ පූර්විකාව කියවා පොත ලිවීමට හේතුව සහ කතුවරයාගේ අරමුණු ආදිය වටහාගත යුතු වන්නේ, තමා අරමුණු කරන පාඨක සමූහයට සාපේක්ෂව එම අරමුණු තක්සේරු කිරීමේ හැකියාව රචකයාට ලැබෙන බැවිනි. පොත කියවීමේදී සටහන් තබා ගැනීම, සාරාංශ කිරීම, ඉදිරිපත්කර ඇති තොරතුරුවල නිරවද්‍යතාව සොයා බැලීම සහ සාධනීය විවේචන ඇත්නම් ඒවාද සටහන් කරගැනීම වැදගත් වෙයි. එසේ සටහන් කරගත් රළු අදහස් ග්‍රන්ථ විචාරය ලෙස අවසානයේදී වඩාත් සංවිධානාත්මක ලෙස ඉදිරිපත්කළ හැකිය. ග්‍රන්ථ විමර්ශකයෙකු මුහුණ දෙන අභියෝගය වනුයේ, දෙනලද කෙටි වචන පරාසයක් තුළ, වඩාත් සමබර, සම්පිණ්ඩනය කරනලද, සහ ග්‍රන්ථයේ මුලික කරුණු සමග වඩාත් සමීපව ගණුදෙනු කරමින් හරවත් කෙටි ලිපියක් සම්පාදනය කිරීමයි.

එමෙන්ම, ග්‍රන්ථ විචාරයක්, ශාස්ත්‍රීය ලිවීමක් වන අතර, එහිදී අදාළ ග්‍රන්ථයේ අන්තර්ගතය, ගුණාත්මක භාවය, අර්ථය මෙන්ම එහි වැදගත්කමත් විචාරපූර්වකව ඇගයීමට ලක්කළ යුතුය. යම් ලේඛකයෙකුගේ ආස්ථානය හොඳින් අවබෝධ කරගැනීම සඳහා, එම ලේඛකයා විසින් රචනා කරනලද අනෙකුත් ග්‍රන්ථ සහ ලිපි පරිශීලනය කිරීම වැදගත් වෙයි. එමෙන්ම, ග්‍රන්ථ විචාරයක් ශාස්ත්‍රීය රචනයක් වන බැවින්, ශාස්ත්‍රීය ලිපි සම්පාදනයේ දී සාමාන්‍යයෙන් ජාත්‍යන්තරව අනුගමනය කරන විධික්‍රම හා ශෛලීන් මෙහිදී ද අනුගමනය කළ යුතු ය. *පඨිතඃ සමාජ සංස්කෘතික සමීක්ෂා* සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු භාෂා ශෛලීන් සහ තොරතුරු මූලාශ්‍ර සටහන් කිරීම පිළිබඳ කරුණු *පඨිත* වෙබ් අඩවියේ පහත සබැඳියාවෙන් ලබාගත හැකඃ http://www.patitha.lk/wp-content/uploads/2019/12/%E0%B7%83%E0%B6%B8%E0%B7%8F%E0%B6%A2%E0%B7%93%E0%B6%BA-%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%8A_%E0%B6%BA%E0%B7%8F-%E0%B6%BD%E0%B7%92%E0%B7%80%E0%B7%93%E0%B6%B8-2012-1-4-60-91.pdf

ග්‍රන්ථ විමර්ශන සඳහා ප්‍රකාශිත උදාහරණ අවශ්‍ය නම්, *පඨිත* නවතම කලාපයේ හෝ *පඨිත* වෙබ් අඩවියේ පළවී ඇති ග්‍රන්ථ විමර්ශන කිහිපයක් වෙත පිවිස පරිශීලනය කළ හැකියඃ http://www.patitha.lk/book-review/

*පඨිත* වෙත එවන ග්‍රන්ථ විමර්ශනයක් වචන 1500 කට අඩු විය යුතුය. මේ පිළිබඳ අමතර තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට ලියන්නඃ patithaj@gmail.com

*පඨිත* අන්තර්ජාල සංස්කරණය කියවීමට, *පඨිත* හා සම්බන්ධ ප්‍රතිපත්ති හා ලිපි සම්පාදනයේදී අනුගමනය කළ යුතු මූලික කරුණු සඳහා *පඨිත* වෙබ් අඩවියට පිවිසෙන්නඃ http://www.patitha.lk/

**පඨිත සංස්කාරක මණ්ඩලය**
**2020**
http://www.patitha.lk/